# ශ්‍රී ලංකාවේ විහාර දේවාලගම් වාසීන්ගේ ඉඩම් අයිතිය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එල්. අයි. කුමාරි[1]***
***චාමින්ද අබේසිංහ[2]***

**සංක්ෂේපය**

මිනිසා යනු අනුල්ලංඝනීය අයිතීන් සහිත මිල කළ නොහැකි සම්පතක් බව නූතන මානව ශිෂ්ටාචාරය තුළ නිදන්ගත වී ඇති සංකල්පයකි. එම අයිතීන් අතර නිදහස් සමාජ ජීවිතයක් ගත කිරීමට පෘථිවියේ ඉඩක් හිමි කර දීම සඳහා විවිධ ආයතන, සංවිධාන උත්සහ දරමින් සිටී. සෑම මානවයෙකුටම වාසස්ථාන හිමි කර දීම සඳහා ලෝකය කෙතරම් දුරට උත්සාහ කළ ද ලෝකය පුරා මිලියන ගණනක් මිනිසුන් භූමියේ හිමිකම නොමැතිව ඕපපාතිකයෝ බවට පත් වී සිටිති. ශ්‍රී ලංකාවේ විහාර දේවාලගම්වාසී නිලමක්කාරයන් හෙවත් නින්දගම්වාසීන් ද එලෙස භූමියේ අයිතිය හිමි නොවූ ජන කණ්ඩායමක් ලෙස හඳුනාගත හැකිය. ඔවුන් වැඩවසම් ක්‍රමයේ ශේෂයන් ලෙසද හැඳින්විය හැක. කතරගම දේවාලය ආශ්‍රිතව තේවාවේ යෙදෙන ආලත්ති අම්මලා තනි තනි පුද්ගලයන් ලෙස සේවයට කැප වී සිටිය ද දේවාලගම් ආශ්‍රිත ජනයා ඊට කැප වී ඇත්තේ පවුල් වශයෙනි. මීට හේතු වූයේ ඔවුන් වාසය කරන ඉඩම් විහාර දේවාලගම් නීතිය මඟින් ආදාළ ආගමික ආයතන සතු කර තිබීමයි. එම නිසා රටේ සෙසු ජනයාට මෙන් තමන් වාසය කරන හා භූමිය ඔවුන් සතු නොවීම විශේෂ ගැටලුවකි. ඒ අනුව මෙම අධ්‍යයනට පාදක වූ මූලික ගැටලුව වන්නේ විහාර දේවාලගම් වාසී ජනතාවගේ ඉඩම් අයිතිය සුරක්ෂිත කළ හැක්කේ කෙසේද? යන්නයි. එහිදී ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා කතරගම කිරි වෙහෙර ආශ්‍රිත විහාර දේවාල ඉඩම් තෝරා ගත් අතර එහි මූලික අරමුණ වූයේ විහාර දේවාලගම් වාසී ජනයා මුහුණ දෙන ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු හඳුනාගෙන එම ගැටලු නිරාකරණය කිරීමට අවශ්‍ය සංශෝධන යෝජනා කිරීමයි. දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිත කළ අතර කතරගම කිරි වෙහෙර ආශ්‍රිත විහාර දේවාලගම් වාසීන් අතරින් සසම්භාවී ලෙස තෝරා ගත් පවුල් 50 කට ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරිම මඟින් ප්‍රාථමික දත්ත සපයා ගැනිණ. දත්ත විශ්ලේෂණය සඳහා Ms Excel මෘදුකාංගය භාවිතා කරන ලදී. මෙම අධ්‍යයනයෙන් අනාවරණය කර ගත් ආකාරයට ඉඩම් අයිතිය හිමි නොවූ පිරිස 70% කි. එම නිසා විහාර දේවාලගම් නිතීය සංශෝධනය කිරීමේදී ඉඩම් පිළිබඳ සින්නක්කර අයිතිය ලබා දිය යුතුයි යනුවන් ප්‍රතිචාර දක්වූවන් 46% ක් බව දක්විය හැකිය.

**මුඛ්‍ය පද :- විහාර දේවාලගම්, විහාර දේවාලගම් නිතීය, වැඩවසම් ක්‍රමය, නින්දගම් වාසීන්, ඉඩම් අයිතිය**

---

**1.**ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, isharakumariliyanage@gmail.com